**10-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ලොකුම රෝගය ශාරීරික අවධානයයි. සම්පූර්ණ පරිහාණිය සිදු වූයේ මෙම රෝගය නිසායි. එමනිසා, ජීව අවධානයට පත්වන්න.

**ප්‍රශ්නය:** ඔය දරුවන් කර්මතීත් තත්ත්වයට පත් වන්නේ කවදාද?

**පිළිතුර:** යෝග බලයෙන් කර්ම වේදනාවන් සියල්ල ජය ගත් විට හා ඔබ මුලුමනින්ම ජීව සත්තාමය අවධානයට පත් වුණු විටයි. ශාරීරික අවධානය යන මෙම රෝගය ලොකුම රෝගයයි. ලෝකය අපිරිසිදු වී ඇත්තේ මෙම රෝගය නිසායි. ජීව අවධානයට පත් වන්න. සතුටින් හා කුල්මත්ව සිටිය හැකි වන අතර ඔබගේ හැසිරීම් රටාවද අලුත් වනු ඇත.

**ගීතය:** නිශාචරයාණනි, වෙහෙසට පත් නොවන්න. ගමනාන්තට වැඩි ඈතක නොවෙයි.

ඕම් ශාන්ති. සංචාරකයා යන්නෙහි අරුත ඔය දරුවන් අසා තිබෙනවා. මුඛයෙන් උපන් දරු පරම්පරාව වන ඔය බ්‍රහමින් දරුවන් හැරෙන්න වෙන කිසිම කෙනෙකුට මෙය පැහැදිලි කරන්න බැහැ. දේවතාවරුන්ව සිටි කල ඔබලාත් මානව ජීවින්. ඔබගේ චරිතයත් ඉතාමත් හොඳින් තිබුණා: ඔබ සියළුම ගුණධර්ම වලින් පිරී සිටි අතර කලා දහසයෙන්ම සම්පූර්ණවයි සිටියේ. ඔබලා ලෝක පාලකවරුන්ව සිටියා. සිප්පි කටු ලෙස සිටි ඔබලා දියමන්ති වූයේ කෙසේද කියා කිසිම මිනිසෙක් දැන සිටියේ නැහැ. ඔබත් තම තමන්ගේ උත්සාහයේ තරමට මුලුමනින්ම වෙනස් වෙලා. ඔබලා තවමත් දේවතාවරුන් වී නැහැ. ඔබලාට නව පණක් දෙමින් සිටිනවා. ඇතැම් අය සුළු ප්‍රමාණයකින් වෙනස් වී තිබෙනවා. ඇතැම් අයගේ චරිතය 5% කින් 10% කින් වෙනස් වී තිබෙනවා. භාරතය දෙව්ලොවක්ව පැවති බව ලෝකයේ මිනිස්සු දන්නේ නැහැ. ක්‍රිස්තුන් වහන්සේ පැමිණීමට වසර 3000 කට පෙර භාරතයේ දේවතාවරුන් සිටි බව මිනිස්සු කියනවා. දෙවි දේවතාවරුන් කියා හැඳින්වීමට තරම් ඔවුන් තුළ ගුණධර්ම ගණනාවක් තිබුණා. දැන් ඔවුන් තුල ඒ ගුණධර්ම නැහැ. එතරම් ධනවත්ව තිබුණු භාරතය පරිහාණියට පත් වූයේ කෙසේද යන්න මිනිසුන්ට තේරෙන්නේ නැහැ. පරමාත්ම පියාම පමණයි මෙය පැහැදිලි කරන්නේ. චරිතය වෙනස් කර ගත් අයට මෙය පැහැදිලි කළ හැකියි. පරමාත්ම පියා කියනවා: දරුවනි, ඔබලා දේවතාවරුන්ව සිටි කල ඔබලා ජීව අවධානයෙන් සිටියා. පසුව රාවන රාජ්‍යය ඇරඹුණු විට ඔබ ශාරීරික අවධානයට පත් වුණා. ලොකුම රෝගය නම් ශාරීරික අවධානයයි. ස්වර්ණමය යුගයේදී ඔබ ජීව අවධානයෙන් සිටි නිසා ඔබ සිටියේ ඉතාමත් සතුටිනුයි. ඔබව ඒ තත්ත්වයට පත් කෙරෙව්වේ කවුදැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. ඔබගේ පරිහාණිය සිදු වූයේ ඇයිදැයි කියා පරමාත්ම පියා පැහැදිලි කර කියා දෙනවා. ඔබට ඔබගේම ධර්මය අමතක වුණා. භාරතය පැන්සයක් තරම්වත් නොවටිනා තැනක් බවට පත් වෙලා. මෙයට ප්‍රධාන හේතුව කුමක්ද? ශාරීරික අවධානය. මෙම නාටකය කල්තබාම තීරණය වූවකි. මෙතරම් ධනවත්ව තිබුණු භාරතය මේ තරම්ම දිළිඳු වූයේ ඇයිදැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. අපි ආදි සනාතන දේවි දේවතා ධර්මයට අයිති අයයි. ඉතින් අපි අපගේ ධර්මයෙන් හා කර්මයෙන් දූෂිත අය වූයේ කෙසේද? පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: රාවන රාජ්‍ය බවට එය පත්වුණු විට ඔබ ශාරීරික අවධානයට වැටුණු නිසා තමයි මේ තත්ත්වයට ඔබ පත්ව තිබෙන්නේ. පරිහාණිය සිදු වන විදිය ඉඟිමහේත් පෙන්වා තිබෙනවා. පැන්සයක් තරම්වත් නොවටිනා කෙනෙක් බවට ඔබ පත්වීමට ප්‍රධානම හේතුව වන්නේ ශාරීරික අවධානයයි. පරමාත්ම පියා මෙහි සිට මෙම කාරණයත් ඔබට පැහැදිලි කර කියා දෙනවා. කල්පයේ කාල පරාසය වසර සිය දහස් ගණනක් වෙනවායි කියා ග්‍රන්ථ වල සඳහන් කර තිබෙනවා. මේ දිනවල ඥානවන්තම අය වන්නේ ක්‍රිස්තියානුවනුයි. ක්‍රිස්තුන් වහන්සේ පැමිණීමට වසර 3000 කට පෙර පාරාදීසය පැවතුණු බව ඔවුනුත් කියනවා. දෙව්ලොව කියා හඳුන්වන්නේ පෞරාණික භාරතයටයි කියා ඔවුන්ට තේරෙන්නේ නැහැ. මේ දිනවල ඔවුන් භාරතයේ සම්පූර්ණ ඉතිහාසය හා භූගෝලය ගැන දන්නේ නැහැ. දරුවන් කිහිප දෙනෙකුට යම් ඥානයක් තිබුණත් තමන් තරම් කෙනෙක් තවත් නැහැයි කියා ඔවුන් සිතනා නිසා ඔවුනුත් සිටින්නේ ශාරීරික අවධානයෙනුයි. භාරතය මෙවන් පරිහාණිකාරි තත්ත්වයකට පත්ව ඇත්තේ ඇයිදැයි කියා පරමාත්ම පියා පැහැදිලි කර කියා දෙනවා. බාබු ගාන්ධිජී පවා කීවේ: පාරිශුද්ධකරුවාණනි පැමිණෙන්න. පැමිණ රාම රාජ්‍යය ස්ථාපනය කරන්න. ජීවාත්මයන් අනිවාර්යෙන්ම තම පරමාත්ම පියාගෙන් යම් මොහොතකදී සතුට ලැබුවා. මෙන්න මේ නිසා තමයි ඔවුන් පාරිශුද්ධකරුවාණන්ව සිහි කරන්නේ. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: ශුද්‍ර තත්ත්වයෙන් බ්‍රහමිණ්වරුන් වන මගේ දරුවන්

පවා මුලුමනින්ම ජීව අවධානයට පත් වන්නේ නැහැ: ඔවුනුත් නිතර නිතරම ශාරීරික අවධානයට වැටෙනවා. මේක තමයි පැරණිම රෝගය. ඔබත් මෙවන් තත්ත්වයකට පත්ව සිටින්නේ මෙය නිසායි. ජීව අවධානයට පත් වීමට ලොකු උත්සාහයක් දැරිය යුතුයි. වැඩි වැඩියෙන් ජීව අවධානයට පත් වුණු විට ඔබත් වැඩි වැඩියෙන් පරමාත්ම පියාව සිහි කරාවි. එමනිසා, කිසිම සීමාවක් නැති සතුටක් ඔබට තිබිය යුතුයි. බ්‍රහ්ම ලෝකයේ එපිට දනව්වේ සිටිනා පරමාත්ම කෙනාව මුණ ගැසීමට ඔබ මඟ බලාගෙන සිටියා. දැන් ඔබට ඔහුව හමුවී තිබෙනවා. උපත් 21 ක උරුමයක් ඔබට ඔහුගෙන් හිමි වෙනවා. තවත් මොනවාද ඔබට අවශ්‍ය කරන්නේ? ජීව අවධානයට පත්ව නිරන්තරයෙන් මා පමණක්ම සිහි කිරීම පමණයි ඔබට කිරීමට ඇත්තේ. ඔබගේ පවුලේ අයත් සමඟ නිවසේ ජීවත් විය හැකියි. මුලු ලෝකයම සිටින්නේ ශාරීරික අවධානයෙන්. එතරම්ම උතුම් භාරතයේ පරිහාණිය සිදු වූයේ එසේයි. එහි ඉතිහාසය හා භූගෝලය කුමක්දැයි කියා කිසිම කෙනෙකුට කිව නොහැකියි. මේ දේවල් කිසිම ග්‍රන්ථයක සඳහන් වී නැහැ. දේවතාවරුන් ජීව අවධානයෙන් සිටියා. තම ශරීර අතහැර දමා තවත් ශරීර ගත යුතු බව ඔවුනට තේරුණා. ඔවුන් පරමාත්ම සිහියේ සිටියේ නැහැ. ඔබ වැඩියෙන් ජීව අවධානයේ සිටි තරමට පරමාත්ම පියාවත් සිහි කළ හැකි වේවි. ඔබත් තව තවත් මිහිරි වේවි. රණ්ඩු , කලබල සහ වානර ගති සියල්ල ඇති වන්නේ ශාරීරික අවධානය නිසායි. පරමාත්ම පියා මේ සියල්ල පැහැදිලි කර කියා දෙනවා. මේ බාබාත් මේ සියල්ල අවබෝධ කර ගන්නවා. ඇතැම් දරුවන් ශාරීරික අවධානයට හසු වී ශිව බාබාව අමතක කර දමනවා. ඉතාමත් හොඳ දරුවන් පවා සිටින්නේ ශාරීරික අවධානයෙනුයි: ඔවුන් ජීව අවධානයට පත් වන්නේ නැහැ. මෙම අසීමිත ඉතිහාසය හා භූගෝලය ඔබට ඕනෑම කෙනෙකුට පැහැදිලි කර කියා දිය හැකියි. සූර්ය හා චන්ද්‍ර වංශ රාජ්‍යයන් අනිවාර්යෙන්ම පැවතුණා. කිසිම කෙනෙක් නාටකය දන්නේ නැහැ. භාරතය දැන් මුලුමනින්ම ඇද වැටී ඇති අතර ඒ පරිහාණියට මුල් වන කාරණය වන්නේ ශාරීරික අවධානයයි. ඇතැම් දරුවනුත් ශාරීරික අවධානයට පත් වෙනවා. තමන්ට උපදෙස් දෙන්නේ කවුදැයි කියා ඔවුන්ට තේරෙන්නේ නැහැ. තමන්ට මේ කතා කරන්නේ ශිව බාබායි කියා සෑම විටම සලකන්න. ශිව බාබා සිහි නොකරනා නිසා තමයි ,ඔබ ශාරීරික අවධානයට ලක් වන්නේ. මුලු ලෝකයම ශාරීරික අවධානයට වැටී ඇති නිසා තමයි පරමාත්ම පියා කියන්නේ: නිරන්තරයෙන් මා පමණක්ම සිහි කරන්න. තමන් ජීවාත්මයක් බව සලකන්න. ජීවාත්මය මෙම ශරීරය හරහා ඇහුම්කන් දී තම චරිත කොටස රඟදක්වනවා. පරමාත්ම පියා ඉතාමත් හොඳින් සියල්ල පැහැදිලි කරනවා. ඔබෙන් ඇතැම් අය ඉතාමත් හොඳ දේශන දුන්නත් හොඳ හැසිරීමකුත් අවශ්‍ය වෙනවා. ශාරීරික අවධානයට ලක් වීම නිසා ඇතැම් අය පරාජය වෙනවා:ඒ සතුට හෝ කුල්මත් බව ඔවුන් තුල නැහැ. එතැනින් ඔවුන් මහත් දඬුවම් විඳීමට සිදු වන ඉතාමත් පාපකාරී ක්‍රියාවන් කරනවා. ශාරීරික අවධානයට ලක් වීමෙන් විශාල හානියක් සිදු වෙනවා. දැඩි දඬුවම් විඳීමට සිදු වෙනවා. පරමාත්ම පියා කියනවා: මෙය පරමාත්ම ලෝක රාජ්‍යයයි. එහෙම නේද? මගේ දේව රාජ්‍යයේ දකුණත වන්නේ ධර්මරාජ්ය. යහපත් ක්‍රියා කළ විට ඉන් යහ ඵල ලැබෙනවා. නරක ක්‍රියා කිරීමෙන් දඬුවම් විඳීමට සිදු වෙනවා. සෑම කෙනෙක්ම සිරකුටියක් වන දරු ගැබක දඬුවමත් විඳිනවා. මේ සම්බන්ධ කතාවකුත් තිබෙනවා. මේ සියල්ල අයිති මේ කාලයටයි. ප්‍රශංසාව අදාල වන්නේ එකම එක පරමාත්ම පියාට පමණයි: වෙන කිසිම කෙනෙකුගේ ප්‍රශංසාවක් නැහැ. මෙන්න මේ නිසා තමයි: ත්‍රිමූර්ති ශිව ජයන්තිය දියමන්තියක් තරම් වටිනවා කියන්නේ. අන් සියල්ල සිප්පි කටුවක් තරම්ය. ශිව බාබා හැරෙන්න වෙන කිසිම කෙනෙකුට ඔබව පාරිශුද්ධ කරවන්න බැහැ. ඔබ පාරිශුද්ධ වුණු විට රාවන ඔබව අපිරිසිදු කරවනවා. සෑම කෙනෙක්ම ශාරීරික අවධානයට ලක් වන්නේ මෙමඟිනි. ඔබලා දැන් ජීව අවධානයට පත් වෙමින් සිටිනවා. මේ ජීව අවධානාත්මක තත්ත්වය උපත් 21 ක් පුරා පවතිනවා. ශ්‍රේෂ්ඨත්වය අදාල වන්නේ එකම එක ඒකායනයට පමණයි. භාරතය දෙව්ලොව බවට පත් කරවන්නේ ශිව බාබායි. ශිව බාබා පැමිණෙන්නේ කවදා දැයි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. ඔහුගේ ඉතිහාසය පළමුවනම ඉතිහාසය විය යුතුයි. පරමාත්ම පියා, පරමාත්ම ජීවය හඳුන්වන්නේ ශිවා කියලයි. පරිහාණිය සිදු වන්නේ ශාරීරික අවධානය නිසායි යන්න ඔබට තේරෙනවා. මෙය සිදු වුණු විට පමණයි පරමාත්ම පියා පැමිණ එය නඟා සිටුවන්නේ. නැග්ම හා බැස්ම දිවා රාත්‍රි: ඥාන සූර්යා පායා මෝහ අන්ධකාරය දුරු කර හරිනවා. ලොකුම මෝහය නම් ශාරීරික අවධානයයි. කිසිම කෙනෙක් ජීවාත්ම ගැන දන්නේත් නැහැ. ජීවය පරමාත්ම ජීවයයි කියා කියනා නිසා ඔවුන් පාපකාරී ජීව බවට පත් වෙලා. මෙන්න මේ නිසා තමයි පරිහානිය සිදු වී තිබෙන්නේ. උපත් 84 ක් ගෙන ඔබ ඉණිමගේ පහළටම ඇදගෙන වැටිලා. මෙම නාටකය කල්බාම තීරණය වුවකි. ඔය දරුවන් හැරෙන්න වෙන කිසිම කෙනෙක් ලෝකයේ ඉතිහාසය හා භූගෝලය ගැනවත් , ලෝකයේ පරිහාණිය සිදු වූයේ කෙසේද කියාවත් දන්නේ නැහැ. විද්‍යාව මඟින් විශාල දියුණුවක් සිදු වී ඇති බව ඔවුන් විශ්වාස කරනවා. ලෝකය තව තවත් අපිරිසිදු අප්‍රසන්න වෙමින් පවතින බව ඔවුනට තේරෙන්නේ නැහැ. ලොකු ශාරීරික අවධානයක් තිබෙනවා. පරමාත්ම

පියා කියනවා: ඔබ දැන් ජීව අවධානයට පත් විය යුතුයි. ඉතාමත් හොඳ මහාරාතීන් සිටිනවා. ඔවුන් ඉතාමත් හොඳින් ඥානය කතා කරනවා. නමුත් තවමත් ඔවුන්ගේ ශාරීරික අවධානය නම් නැති වී නැහැ. ශාරීරික අවධානය නිසා ඇතැම් අය තුල කේන්තියේ ගති ලක්ෂණත්, තවත් කෙනෙක් තුළ බැඳීමේ ගති ලක්ෂණත් තිබෙනවා: එකක් නැතිනම් තවත් එකක්ඇති වෙනවා. චරිතය අලුත් කරවිය යුතුයි. ඉතාමත්ම මිහිරි වන්න. මෙන්න මේ නිසා තමයි එකම දිය පහරින් සිංහයා හා බැටළුවා වතුර බොනවා පෙන්වා තිබෙන්නේ. එහිනම් දුක් දෙන සතෙක් ඇත්තේ නැහැ. කලාතුරකින් කෙනෙකුට තමයි මේ කියනා දේවල් තේරෙන්නේ. ඔවුන් එක් එක් මට්ටම් වලින් තේරුම් ගන්නවා. කර්ම වේදනාවන් අවසන් කර දමා ඔවුන් කර්මතීත් වන්නේ බොහෝම අපහසුවෙන්. බොහෝ අය ශාරීරික අවධානයට ලක් වෙනවා. මේ උපදෙස් දෙන්නේ කවුදැයි කියා ඔවුන් දන්නේ නැහැ. ශ්‍රී ක්‍රිෂ්ණාගෙන් ශ්‍රීමත් ගත හැක්කේ කෙසේද? ශිව බාබා කියනවා: මොහු නැතිව මම කොහොමද ඔබලාට ශ්‍රීමත් දෙන්නේ? මොහු තමයි මගේ රථය ලෙස සහතික වී තිබෙන්නේ. ශාරීරික අවධානයට ලක් වී වැරදි ක්‍රියා කර තමාව නිරපරාදේ විනාශ කර ගන්න එපා. එහි ඵල විපාක කොයි වගේ වේවිද ? ඉතාමත් අඩු තත්ත්වයක් ලැබීමට සිදු වේවි. නූගත් අයට උගත් අය ඉදිරියේ දණ නැමීමට සිදු වේවි. භාරතයේ ඉතිහාසය හා භූගෝලය එය විය යුතු ආකාරයෙන්ම පරිපූර්ණ නැහැ කියා බොහෝ අය කියනවා. මෙය ඔවුන්ට පැහැදිලි කර කියා දිය යුතුයි. ඔබ හැරෙන්න වෙන කිසිම කෙනෙකුට මෙය පහදා දිය නොහැකියි. කෙසේවෙතත්, ජීව අවධානාත්මක තත්ත්වයක් අවශ්‍යයි. එවන් අයට පමණයි උසස් තත්ත්වයක් දිනා ගත හැක්කේ. තවමත් කිසිම කෙනෙක් කර්මතීත් තත්ත්වයට ළඟා වී නැහැ. මොහුට (බ්‍රහ්ම බාබා) වගකීම් රැසක් තිබෙනවා. නාටකයට අනුව සියල්ලම සිදු වන බව දැන ගෙන සිටියත් ඔහුටත් විවිධ කනස්සලු ඇති වෙනවා. ඒ වුණත් ඔබට පැහැදිලි කිරීමට විවිධ ක්‍රම විධි අවශ්‍ය වෙනවා. මෙන්න මේ නිසා තමයි බාබා කියන්නේ: ඔබට තව තවත් ජීව අවධානයට පත් විය හැකියි. ඔබට කිසිම බරක් නැහැ. පියෙකුට විශාල බරක් තිබෙනවා. මොහු ප්‍රජාපිතා බ්‍රහ්මා තමයි ප්‍රධාන. නමුත් ඔහු තුළ ශිව බාබා සිටිනා බව කිසිම කෙනෙක් දන්නේ නැහැ. ඔබ අතරිනුත් කලාතුරකින් කෙනෙක් තමයි මෙම විශ්වාසයේ සිටින්නේ. ඔබ මෙම ඉතිහාසය හා භූගෝලය ගැන දැන සිටිය යුතුයි. භාරතය පුරා දෙව්ලොව තිබුණු අතර දැන් එය කොහේ ගිහින්ද? එහි පරිහාණිය සිදු වූයේ කෙසේද? කිසිම කෙනෙක් මෙය දන්නේ නැහැ. ඔබ පැහැදිලි කළහොත් ඇරෙන්න කිසිම කෙනෙකුට මෙය තේරෙන්නේත් නැහැ. මෙන්න මේ නිසා තමයි බාබා ඔබට උපදෙස් දී තිබෙන්නේ.පාසල් වල අයට මෙය ලියා දන්වා ඉතිහාසය හා භූගෝලය පෙන්විය යුතු බව ඔවුන්ට කියන්න. මෙම පරිහාණිය පිළිබඳව ඔබ දේශන දිය යතුයි. භාරතය දියමන්තියක් සේ තිබුණා: දැන් එය සිප්පි කටුවක් වූයේ කෙසේද? මෙයට අවුරුදු කීයක් ගත වුණාද? මේ සියල්ල අපට පැහැදිලි කළ හැකියි. අහස් යානා වලින් අත් පත්‍රිකා බෙදා හැරිය හැකියි. පැහැදිලි කරනා අය ඉතාමත් දක්ෂ විය යුතුයි. ආණ්ඩුවටත් මෙය අවශ්‍යයි. එමනිසා, ඔබ සෑම කෙනෙක්වම දිල්ලි නුවර පිහිටි විග්‍යාන් භවන් හි රාජ්‍ය ශාලාවට ආරාධනා කළ යුතුයි. එය පුවත් පත් වලත් මුද්‍රණය කළ යුතුයි. ඒ වගේම සෑම කෙනෙකුටම ආරාධනා පත්‍රත් යවන්න. අපි මුලු ලෝකයේම ඉතිහාසය හා භූගෝලය මුල සිට අග දක්වාම ඔබට පැහැදිලි කර කියා දෙන්නම්. ඔවුන් ඇවිත් යාවි. මුදල් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. උදාහරණයක් ලෙස කිවහොත් ඔබට තෑග්ගක් දීමට කැමති කෙනෙක්ව ඔබට මුණ ගැසුනොත් ඔබ එය නොපිළිගත යුතුයි. එය සේවය සඳහා භාවිත කළ යුතුයි. තමා වෙනුවෙන් භාර නොගත යුතුයි. පරමාත්ම පියා කියනවා: ඔබෙන් ලැබෙන දෙයක් ගෙන මම මොනවා කරන්නද? ඒ සියල්ල ආපසු නැවත දීමට මට සිදු වේවි. මම තමයි ඉතාමත් දක්ෂ තොග ව්‍යාපාරිකයා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ශාරීරික අවධානයට ලක් වී කිසිම වැරදි ක්‍රියාවක් කරන්න එපා. ජීව අවධානයට පත් වීමට සම්පූර්ණ උත්සාහය දරන්න. දිගින් දිගටම ඔබගේ චරිතය අලුත් කර ගන්න.
2. ඉතාමත් මිහිරි නිවුණු කෙනෙක් වන්න. කෝපය හා බැඳීම යන පාපයන් ඔබ තුලින් ඉවත් කරලන්න.

**වරදානය:** ඔබ ගෞරවය දීමේ වාර්තාව යහපත් ලෙස තබාගෙන පුණ්‍ය ජීවාත්මයක් ලෙස සතුටේ මහා දානයන් සිදු කරත්වා.

මේ අවස්ථාවේ දී, ඔබ සැමට සැම තැනකම ඔබේ ගෞරව කිරීමේ වාර්තාව යහපත් ලෙස තබා ගත යුතුය. එවිට මෙම වාර්තාව සැම තැනකම වාදනය වනු ඇත. ගෞරවය දෙන්න, ගෞරවය ලබන්න, බාල අයට ගෞරවය දෙන්න, වැඩිහිටියන්ට ගෞරවය දෙන්න. ඔබ ගෞරව දීමේ වාර්තාව දැන් තබා ගන්න, එවිට ඔබ මහා පරිත්‍යාගශීලියෙකු සහ සතුටේ පරිත්‍යාගය ලබා දෙන පුණ්‍ය ජීවාත්මයක් බවට පත්වනු ඇත. කෙනෙකුට ගෞරවය දීමෙන් සතුටු කිරීම මහා පුණ්‍ය ක්‍රියාවකි; එය සැබෑ සේවයකි.

**පාඨය:** සැම මොහොතක්ම අවසාන මොහොත ලෙස සලකමින් ඉදිරියට යන්න, එවිට ඔබ සැම විටම සූදානම්ව සිටිනු ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් බියෙන් හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

ඥානයෙ විෂය ඇති සේම, සේවයේ විෂය ද ඇති අතර, බුද්ධියෙ ශ්‍රද්ධා විශ්වාසයක් ඇති අයට පමණක් ඉදිරි අංකයක් ලබා ගත හැකිය. උදෑසන සිට රාත්‍රිය දක්වා, ඔබටම වැඩසටහනක් සකස් කර ගන්න, ඔබේ දෛනික දිනපොත සාදන්න, මන්ද ඔබ වගකීමක් ඇති ජීවාත්මයන් ය. ඔබ සාමාන්‍ය ජීවාත්ම නොව, ලෝක දානපති ජීවාත්මයන් ය. පුද්ගලයෙකු කෙතරම් ශ්‍රේෂ්ඨ වුවත්, ඔහුගේ දෛනික කාලසටහන ඒ අනුව සකසා ඇත.

**මාතේශ්වරීජීගේ අමිල ශ්‍රේෂ්ඨ වදන්**

**1) තමෝගුණී මායාගේ ව්‍යාප්තිය.**

'සතෝගුණී, රජෝගුණී සහ තමෝගුණ' යන වචන තුන භාවිත කරන නමුත් මේවා නිවැරදිව වටහාගැනීම අවශ්‍යයි. මිනිසුන් සිතන්නේ මෙම ගුණධර්ම තුන එකවර පවතින බව කියාය, නමුත් බුද්ධිය අපට කියන්නේ කුමක්ද? මෙම ගුණදම් තුන නොකඩවා එකවර පැවති තිබේද, එසේත් නැත්නම් මෙම ගුණදම් එකිනෙකෙහි කොටස, ඒ ඒ යුගයේ වෙන්ව තිබේද? බුද්ධිය අපට කියන්නේ මේ ගුණදම් තුන එකවර නොපවතින බවයි. එය ස්වර්ණමය යුගය (සත්‍යුගය) වන විට, එය සතෝගුණීය, එය තඹ යුගය වන විට රජෝගුණී වන අතර එය කලි යුගය වන විට එය තමෝගුණීය. එය සතෝ වන විට එය රජෝ හෝ තමෝ නොවෙයි. එය රජෝ වන විට එය සතෝගුණී නොවේ. මේ තුනම එකවර පවතින බව මිනිසුන් නොකඩවා විශ්වාස කර ඇත. මෙසේ පැවසීම විශාල වැරදීමකි. ඔවුන් විශ්වාස කරන්නේ, පුද්ගලයෙක් සත්‍යය පවසන විට සහ කිසිදු පාපයක් නොකරන විට, ඔහු සතෝගුණී බවය, නමුත් බුද්ධිය අපට කියන්නේ, අප සතෝගුණී යැයි පවසන විට, ඉන් අදහස් වන්නේ සම්පූර්ණ සතුට ඇති බවයි, එනම්, මුළු ලෝකයම සතෝගුණීය. සත්‍යය පවසන කෙනෙක් සතෝගුණී බවත් මුසාවන් පවසන කෙනෙක් කලි යුගී සහ තමෝගුණී බවත් ඔබට කිව නොහැක. ලෝකය මේ ආකාරයෙන් පැවතී ඇත. එය ස්වර්ණමය යුගය බව අප පවසන විට, ඉන් අදහස් වන්නේ, මුළු ලෝකයම සතෝගුණී සහ සතෝප්‍රධාන් බවයි. ඔව්, මුළු ලෝකයම සතෝගුණී වූ විට, එක් කාලයක එවන් ස්වර්ණමය යුගයක් තිබුණි. එම සත් යුගය (ස්වර්ණමය යුගය) දැන් නොපවතී. දැන් එය කලි යුගී ලෝකයයි, එහි අරුත වන්නේ මුළු ලෝකයම තමෝප්‍රධාන් රාජධානිය බවයි. තමෝප්‍රධාන් ලෝකයේ කිසිම සතෝගුණී දෙයක් තිබෙන්නේ කෙසේද? දැන් උපරිම අන්ධකාරය තිබේ, එය බ්‍රහ්මගේ රාත්‍රිය ලෙස හැඳින්වෙයි. බ්‍රහ්මගේ දහවල ස්වර්ණමය යුගය වන අතර බ්‍රහ්මගේ රාත්‍රිය කලි යුගයයි, එබැවින් අපට ඒ දෙක සම්බන්ධ කළ නොහැක.

**2) ඔබව කලි-යුගී නීරස ලෝකයෙන්, සාරයෙන් පිරි ස්වර්ණමය ලෝකයට ගෙන යාම, පරමාත්ම දෙවියන්ගේම තනි කාර්යයයි.**

කලි යුගී ලෝකය, නීරස ලෝකය ලෙස හැඳින්වෙන්නේ ඇයි? මේ ලෝකයට කිසිදු සාරයක් නොමැති නිසයි, එනම්, කිසිම දේක ශක්තියක් ඉතිරි වී නැත, එනම් සතුට, සාමය හෝ පිවිතුරු බව නැත ලෝකයේ තිබුණු සතුට, සාමය සහ පිවිතුරු බව නොමැත. එම ශක්තිය තව දුරටත් නැත, මන්ද මේ ලෝකය තුළ පංච පාපයන් තිබේ. එබැවින් මේ ලෝකය, බිය සාගරය, සහ කර්ම බන්දන වල සාගරය ලෙස හැඳින්වෙයි. මේ නිසයි

මිනිසුන් දුකට පත් වී දෙවියන්ට කන්නලව් කරන්නේ. දෙවියනේ අපව සයුරින් එතෙර එහා පැත්තට ගෙන යන්න. මින් ඔප්පු වන්නේ බිය නොමැති ලෝකයක් අනිවාර්යෙන් තිබෙන බවයි, එනම්, ඔවුන්ට යාමට අවශ්‍ය බිය නොමැති ලෝකයක් තිබෙන බවය. මේ ලෝකය පාපයන්ගේ සාගරය ලෙස හැඳින්වෙන්නේ ඒ නිසයි, ඔවුන්ට අවශ්‍ය වන්නේ මෙය අතහැර එතෙර වී, පුණ්‍යවන්ත ජීවාත්මයන්ගේ ලෝකයට යාමටයි. එබැවින් ලෝක දෙකක් තිබේ එකක් සාරයෙන් පිරි ස්වර්ණමය යුගී ලෝකය වන අතර අනෙක නීරස, කලි යුගී ලෝකයයි. ලෝක දෙකම පවතින්නේ මෙම පොළෝ තලය මතයි. පරමාත්ම දෙවියන් දැන් එම සාරයෙන් පිරි ලෝකය ස්ථාපිත කරනවා. අච්චා.